භාෂාව මගින් ජනසමාජයකට එල්ල කරනා බලපෑමට එක් උදාහරණයක් වන්නේ, සමාජය තුළ භාවිතා වන යම් යම් යෙදුම් ඔස්සේ පුද්ගලයන්ට හෝ පුද්ගල කණ්ඩායම් වලට සිත් වේදනාවන් ඇති වීම, ඔවුන්ව සමාජය තුළ ගර්හාවට ලක්වීම හෝ ඔවුන් සම්බන්ධයෙන් සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් ඇතිවීමයි. මෙනිසාම, එවන් යෙදුම් සම්බන්ධයෙන් දෙවරක් සිතාබැලීමට අපට සිදුවන අතර, මාධ්‍යද තමන් විසින් එවැනි යෙදුම් සමාජය තුළට යලි යලිත් සන්නිවේදනය කිරීම සම්බන්ධයෙන් නැවත සිතාබැලිය යුතු වේ.

මේ සඳහා උදාහරණයක් ලෙසින්, මව්බිම පුවත්පතේ (11/06) පළවී ඇති මෙම පුවත් වාර්තාව දැක්විය හැක.

මෙහි "දූෂණය" යන යෙදුම සඳහන් වී ඇත. නමුත් දූෂණය හෝ කෙළෙසීම වැනි යෙදුම් ඔස්සේ වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක් දැක්වෙන බැවින්, මෙවන් පුවත් වාර්තාවක යෙදිය යුතු වඩාත් යෝග්‍ය යෙදුම වන්නේ ලිංගික අපරාධය බව පැවසීමට සිදුවේ.

එසේම මෙහි "ගොළු කාන්තාවක" යනුවෙන් වන හැඳින්වීමද අවධානයට ගත යුතු වේ. ගොළු යන යෙදුම හා බැඳී ඇති අවමානාත්මක, වෙනස් ලෙසින් සැලකීමේ ආකල්පය සමගින් එවැනි යෙදුම් අත්හැරිය යුතු බව මේ පිළිබඳව වන ජාත්‍යන්තර නිර්දේශයන්හි දැක්වෙන අතර, ඒ වෙනුවට යෝග්‍ය වන්නේ "කථන ආබාධයක් සහිත කාන්තාවක්" වැනි යෙදුමක් නොවේදැයි අප විමසිය යුතු වේ.

මූලාශ්‍ර:

https://adata.org/factsheet/ADANN-writing...

http://www.disability.wa.gov.au/.../words_that_work_media...

**#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima**
See Less